**2023**

# වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

# வருடாந்த செயலாற்று அறிக்கை மற்றும் கணக்கறிக்கை

# Annual Performance Reports & Accounts




Designed : IT Unit ,Distsec Ampara

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර.
மாவட்ட செயலகம் - அம்பாறை.
District Secretariat - Ampara .

# දිසාපතිතුමාගේ පණිවුඩය



2023 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලැබූ සේවාවන් හා සිදු කරනු ලද ව්‍යාපෘතීන් කේන්ද්‍ර කොට ගනිමින්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටින් සහ තෘප්තියෙනි. 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී මූල්‍ය පාලනය පාදක කර ගනිමින් මෙම වාර්තාව පිළියෙල කර ඇත.

ගල්ඔය ගංගා නිම්නයේ ජනපදකරණයට යටත් වූ පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ජාතික නිෂ්පාදනයේ විශාල පංගුවකට හිමිකම් කියන අම්පාර දිස්ත්‍රික්කය සාර්ථක කරදිය සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයෙන් ද රටෙහි පෝෂණ අවශ්‍යතා සපුරා ලීමට දායක වේ. විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතනයක්, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික පාසල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු කාර්මික පුහුණු ආයතන හා පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ශනීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මඟුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය, කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බවට පත්වී ඇත.

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරු පිරි දිස්ත්‍රික්කයක් ලෙස ගොඩනැඟෙමින් පවතින අම්පාර දිස්ත්‍රික්කයට අතිගරු ජනාධිපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන් වන "අස්වැසුම" සමාජ ශුභ සාධන වැඩසටහන සහ කෘෂි නවීකරණ වැඩසටහන, දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මාන්ත ව්‍යාපෘතිය, වාරිමාර්ග අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන, ග්‍රාමීය ජීවනෝපාය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කෙරෙනඋඳු/මුං වගා ව්‍යාපෘතිය යනාදී සියලුම රජය මඟින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් හරහා අදට සහ මතුවට ද කෘෂි කර්මාන්තයෙන් පරිපූර්ණ වූ තිරසර ගොවිතැනින් සුරක්ෂිත ආහාර වැඩපිළිවෙලක් දැයට දායාද කිරීම අරමුණු කොට ගත් මෙම ව්‍යාපෘති දිස්ත්‍රික්කයේ හෙට දවස වෙනුවෙන් සිදුවන මහඟු ආයෝජනයක් වනු ඇත.

කෘෂි ආර්ථිකය ජීවනාලිය කරගත් දිගාමඩුලු ගොවි ජනතාව, ආර්ථික වශයෙන් සවි බල ගන්වමින්, පවත්නා ගොවිපල පද්ධතිය තිරසර, හරිත ගොවි පද්ධතියක් බවට කළමනාකරණය කරමින්, යෝග්‍ය තාක්ෂණය උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිත කර ප්‍රශස්ත ඵලදායීතාවයක් ලබා ගනිමින්, දිගාමඩුලු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජාතික ආර්ථිකයේ ප්‍රමුඛතම ආහාර නිෂ්පාදකයා වෙමින්, විදේශීය වෙළඳපොල කෘෂි නිෂ්පාදන ඔස්සේ ජය ගනිමින්, ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම අපගේ මුඛ්‍ය පරමාර්ථය යි. එකී සුවහසක් ජනයාගේ ජීවිත විකසිත කරමින් ඉසුරු පිරි හෙට දිනයක් උදා කරනු වස් අදාළ චක්‍රලේඛ, අණ පනත්, නීති රීති, රෙගුලාසි වලට අනුගත වෙමින්, එහෙත් හැකි උපරිමයෙන් ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා හැකි උපරිම ධාරිතාවය යොදවමින්, පළාතේ දේශපාලන අධිකාරියේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ, රාජ්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමේ අති භාර දූර වගකීම අපගේ උර මත පැටවී ඇත. මෙකී වගකීම ඉටු කිරීමේදී, මෙම කාර්ය සාධන වාර්තාවේ සඳහන් අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුශාෂකත්වය ලබාදුන් සර්ව ආගමික නායකත්වය ද සහයෝගය ලබාදුන් දේශපාලන අධිකාරිය ද එයට අමතරව මෙම කර්තව්‍යයන් උදෙසා සෘජු හෝ වක්‍රව අප හා සම්බන්ධ වූ අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රධානීන් සහ

කාර්ය මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන, ග්‍රාමීය කමිටු යනාදීය ද ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙකී කාර්ය භාරය තුල, ඉහල කාර්ය සාධනයකින් යුතුව මෙම වාර්තාවේ සඳහන් ඉලක්ක කරා ළඟා වීම සඳහා ඉතා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ පිරිස වූයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල පද්ධතිය අතර සමායෝජනය හා කළමනාකරණය කරමින්, පසුගිය වසරේ දී අපගේ ඉලක්ක සපුරා ගැනීමට උපරිම දායකත්වය සැපයූ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැළසුම්) හා අනෙකුත් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ඉංජිනේරු සහ සියලුම කාර්ය මණ්ඩලයටත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රධාන එම කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රශංසාව පිරිනමමි.

එසේම, පවතින ආර්ථික අර්බුදය හමුවේ, සංවර්ධන වැඩසටහන් සහ අනෙකුත් රජය මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ අනෙකුත් ප්‍රාදේශීය මට්ටමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා උග්‍ර මූල්‍ය අර්බුදය නැමති බරපතල අභියෝගය ජයගනු වස් එම වැඩසහන් වලට සම්බන්ධ නිලධාරීන් සමඟ, අදාල අනෙකුත් පාර්ශව සමඟ සාකච්ඡා කොට, ඒ සඳහා විකල්ප ක්‍රමෝපායන් අවස්ථානෝචිතව යොදා ගනිමින්, එම වැඩසටහන් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කර, අපේක්ෂිත ඉලක්ක කර ලගා වීමට හැකියාවක් ලැබුණු බව සතුටින් සිහිපත් කරන අතර, කර්මාන්ත, ස්වයංරැකියා, වෙළඳාම, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි එදිනෙදා ජන ජීවිතය අඩාල නොවන පරිදි දිස්ත්‍රික්කය සාමකාමීව පවත්වාගෙන යාමට හැකිවූ බව සතුටින් සිහිපත් කරන අතර, ඒ සඳහා ඍජු සහ වක්‍ර අයුරින් දායක වූ සියලු නිලධාරීන් ඇතුළු මහජනතාවට මාගේ ප්‍රශංසාව පළ කරමි.



චින්තක අබේවික්‍රම,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

Contents


01. **පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය** ........ 1

**1.1 හැඳින්වීම** ........ 1

**විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය** ........ 1

**1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු** ........ 4

**1.3 ප්‍රධාන කාර්යයන්** ........ 5

**1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර** ........ 6

**1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන** ........ 7

**1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන** ........ 8

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)** ........ 8

02. **පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** ........ 9

**03 පරිච්ඡේදය** - 20**22 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය** ........ 13

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය** ........ 13

**3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය** ........ 15

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්** ........ 16

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය** ........ 27

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන** ........ 29

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය** ........ 32

**3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව** ........ 33

04. **පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක** ........ 48

**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)** ........ 48

05. **පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක** (SDG) **සාක්ෂාත් කර ගැනීම.** ........ 49

**5.1 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය** ........ 49

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න.** ........ 54

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** ........ 55

**06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය** ........ 55

**06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම** ........ 55

**06.3 මානව සම්පත් සංවර්ධනය** ........ 56

**07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව** ........ 57

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

### විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය

පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. මෙහි භූමිය තැනින් තැන පිහිටි ශේෂ කඳුවලින් යුක්ත තැනිතලාවකි. මේ තැනිතලාව මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 200 දක්වා ද හෙල් මුදුන්වල අඩි දහස දක්වා ද උස්ව පිහිටියේය. මේ සැබවින්ම සියල් සරින් පිරි බිම් කඩෙකි. ඈත ඌවේ කඳුකරය පශ්චාත් භාග කොට ගත් අඳුරු වන තීරයෙන් ආරම්භ වී මෑත වෙරළ තීරය තෙක්ම එක එල්ලේ විහිදී ගිය මනහර වෙල්යායෙකි. එය පෙර රජ දවස දකුණු දිග වෙරළ තීරය දක්වාම පැතිර පැවතියෙකි. මේ පෙදෙසේ සිත්කළු දර්ශනය ඍතුවෙන් ඍතුව වෙනස් වෙස් ගෙන බැබළෙති. වැසි කලට නිබඳ දියෙන් පිරීගත් කලපුවක සිරි ගන්නේය. ඊසාන මෝසම දුර්වන වෙද්දී පළාවන් ගොයමින් වැසි හරිත සමුද්‍රයක ශෝභාව පාන්නේය. ගොයම වැඩෙද්දී සිංහල ,දෙමළ හා මුස්ලිම් ගොවි දනන්ගේ පැල් වෙල් යායේ තැනින් තැන පැන නැග එයි. කුඹුර පැසෙද්දී ඈත වන තීරයෙන් එළි බැස එන අලින්, ඌරන්, මොණරුන් වැනි වන සතුන් මතු වෙයි. නැවත අස්වනු අස් කොට ගත් පසු මේ භූමිය එළ, මී, ගවයින් සිය ගණනින් සැදී රංචු සැරිසරන සුන්දර දර්ශනයක් මවයි. වියළි අගෝස්තුව වන විට දීප්ත සූර්ය රශ්මියෙන් පොළව දා ගිය කල සතෙකුට තණපතක් දිය බිඳක් නැති කර්කශ, වේගවත් මාරුතයෙන් උඩ නැගී කැරකෙන දූවිල්ලෙන් වැසුණු බිමක් බවට පෙරළේ.

මඩකලපුව දිසාපතිවරයා යටතේ රටේ මහත්තුරුන් විසින් පරිපාලන රාජකාරි සිදු කරන ලද මෙම බිම් කඩෙහි 1924 දී වැව්ගම්පත්තුව නමින් නව පරිපාලන ඒකකයක් ස්ථාපිත විය. වැත්තැවේ රටේ මහත්තයා එහි පළමු රටේ මහත්තයා වූ අතර, පැරණි වාරිමාර්ග නැවත පිළිසකර කිරීමේ කටයුතු වේගවත්ව එම කාලය තුළ දී සිදුව ඇත. එලෙස ඇරඹි සංවර්ධනයේ කූඨප්‍රාප්තිය සනිටුහන් කරමින් ඩී.එස්.සේනානායක ශ්‍රීමතාණන්ගේ මෙහයවීමෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය දියත් විය. එම ගොවි ජනපද ව්‍යාපාරයේ අනගිතම නිමවුම අම්පාර දිස්ත්‍රික්කයයි. වැව්ගම්පත්තුව, බින්තැන්නපත්තුව, පානම්පත්තුව, සම්මන්තුරේපත්තුව, නින්දවූර්පත්තුව, අක්කරපත්තුව ඇතුළු පැරණි පරිපාලන ඒකක එකතු කර 1961 වර්ෂයේදී අම්පාර නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ස්ථාපිත විය. 1961 අප්‍රේල් 10 දින ජේ.ඩී.එස්.ඩී ලියනගේ මහතා මෙහි පළමු දිසාපතිවරයා ලෙස පරිපාලන රාජකාරී ඇරඹීය. 80 දශකයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සී කලාපය හෙවත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය ද මෙම දිස්ත්‍රික්කයට එක් විය. වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය සම්මන්තුර ,කල්මුණ, පොතුවිල්, අම්පාර යන ඡන්ද ප්‍රදේශ 04 ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක්, ග්‍රාම නිලධාරී වසම් 503 ක් හා ගම්මාන 614 කින් සමන්විතය. ඒ අතර, මහනගර සභා 02 ක් නගර සභා 01 ක් ප්‍රාදේශීය සභා 17 ක් හා පොලිස් ස්ථාන 14 ක් පවතී. කිලෝමීටර් 115 ක් පුරා දිවෙන දර්ශනීය වෙරළ තීරය ද, තැනින් තැන පිහිටි ශේෂ කඳු ද, ගමින් ගම පිහිටි නිල්දිය පිරි මහ වැව් ද, ඒ වැව් ඔස්සේ පීදෙන හරිත වෙල් යාය ද, වන සතුන් නිදහසේ සරනා වන ගොමු ද, මෙම දිස්ත්‍රික්කයේ සුන්දරත්වය සේම වටිනාකම ද ඉහළ නංවයි. දිස්ත්‍රික්කයේ බහු ආගමික, බහු සංස්කෘතික උරුමයන් විදහා දක්වමින් විහාරස්ථාන 223 ක් ද, හින්දු කෝවිල් 203 ක් ද, මුස්ලිම් පල්ලි 369 ක් හා ක්‍රිස්තියානි පල්ලි 74 ක් ද පවතී.

ජන සංඛ්‍යා ලේඛණ දත්තවලට අනුව (දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ 2019) අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනය සමස්ථ ජනගහනය 728,086 කි. පවුල් සංඛ්‍යාව 205,211 ක් වේ. මෙම සමස්ථ ජනගහනය තුළ 41.49% ක් මුස්ලිම් ජනතාව ද, 35.32% ක් සිංහල ජනතාව ද 22.581% ක් දෙමළ ජනතාවගෙන් හා 0.6% ක් අනෙකුත් ජනතාව ද නියෝජනය වන අතර, මෙම සියලු ජාතීන් සමඟියෙන් හා සහජීවනයෙන් ජීවත් වෙති.

මෙම දිස්ත්‍රික්යේ වපසරිය වර්ග කිලෝමීටර් 4,415 ක් වේ.. මෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,264.47 කි. අභ්‍යන්තර ජලාශ ලෙස වර්ග කිලෝමීටර් 328.03 ද වනාන්තර ප්‍රමාණය (Forest & Range Land ) වර්ග කිලෝමීටර් 2,097.53 ක් ද වේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1,886 ක් පමණ වන අතර, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.81 ක මට්ටමේ පවතී.

දිවයිනේ විශාලතම ජලාශය වන සේනානයක සමුද්‍රය ආශ්‍රිත වාරි පද්ධතිය මඟින් පෝෂණය වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් 22.5% ක් දැයට උරුම කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ '' ජාතියේ වී බිස්ස" යන විරුදාවලිය ලත් අම්පාර දිස්ත්‍රික්කය උක් වගාව, අතිරේක බෝග වගාව, පශු සම්පත් සහ

සාර්ථක කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ජාතික ආහාර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය හිමි කරගෙන ඇත.

විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතන, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායිතා සම්මානයන්ගෙන් පිදුම් ලත් සෞඛ්‍ය සේවයක් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වීම ගොවි ජනයා ප්‍රමුඛ ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ෂණීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, කුමන ජාතික කුරුලු උයන, ලාහුගල ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මගුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය , කඩක්කරෙර පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරයන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇත.

## අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි. රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපී හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඩුවස් දෙව් රජුගේ අවධියේය. පඩුවස් දෙව් රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපී,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ටාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතුවලදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යයන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි. මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉඨික තෙර මහිඳ තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්විපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨිය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිඳු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨිය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිඳු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි. එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ

බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදී දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගනිති. එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොළී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතුන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නිග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනිම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවීම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදී පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය. පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෲක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පළාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවුණි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**<u>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර</u>**
**<u>ප්‍රකාශය හා අගයන්</u>**

### දැක්ම

**විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්**.

### මෙහෙවර

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර තිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් හොඩ නැගීම.

### අපේ අගයන්

- හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- යහපානලමය යොමුවක්

## 1.3 ප්‍රධාන කාර්යයන්

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.</u>**

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්යය ( ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයුතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිලධාරින්ගේ පරිපාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු

**<u>දිස්ත්‍රික් ලෙක්ම් කාර්යාලයේ ගිණුම් අංශයේ කාර්යය භාරය</u>**

- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ප්‍රතිපාදන හා අක්මුදල් බෙදා හැරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ගිණුම් වාර්තා සකස් කිරීම හා ගණන්දීමේ නිලධාරී වෙත වාර්තා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ගෙවීම් කටයුතු

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාරය</u>**

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ටාර්වරුන් හා හදිසි මරණ පරික්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාමලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

## 1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර



## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැඳි පවතී. බොහෝ දෙනෙකු මෙය හදුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර |
|---|---|---|---|
| 1 | දෙහිඅත්තකණ්ඩිය | 13 | 121 |
| 2 | පදියතලාව | 20 | 82 |
| 3 | මහඔය | 17 | 62 |
| 4 | උහන | 55 | 11 |
| 5 | අම්පාර | 22 | - |
| 6 | දමන | 33 | 17 |
| 7 | ලාහුගල | 12 | 80 |
| 8 | පොතුවිල් | 27 | 75 |
| 9 | තිරුක්කෝවිල් | 22 | 42 |
| 10 | ආලයඩිවෙම්බු | 22 | 28 |
| 11 | අක්කරපත්තුව | 28 | 28 |
| 12 | අඩ්ඩාලච්චේන | 32 | 29 |
| 13 | ඉරක්කාමම් | 12 | 10 |
| 14 | නින්දවුර් | 25 | 26 |
| 15 | කාර්තිව් | 17 | 24 |
| 16 | සායින්දමරුදු | 17 | 25 |
| 17 | කල්මුණ | 29 | 28 |
| 18 | කල්මුණ උතුර (උපකාර්යාලය) | 29 | 28 |
| 19 | නාවිදන්වේලි | 20 | 24 |
| 20 | සම්මන්තුර | 51 | 20 |

## 1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

| අනු අංකය | දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ |
|---|---|
| 1. | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය |
| 2. | සහකාර මැතිවරණ කොමසාරිස් කාර්යාලය |
| 3. | දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය |
| 4. | සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 5. | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලය |
| 6. | මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 7. | දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය. |
| 8. | ආපදා කළමනාකරණ අංශය |
| 9. | දිස්ත්‍රික් ක්‍රීඩා අංශය |
| 10. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 11. | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්) |
| 12. | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය |
| 13. | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය |
| 14. | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය. |
| 15. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය |
| 16. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය. |

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

හිස් වාර්තාවකි.

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2023 වර්ෂයේ ළඟා කරගත් ඉලක්ක

### 01. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ක්‍රියාකාරකම්

2023 වර්ෂයේ දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති අතර එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය, නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය, ධීවර සංවර්ධන ව්‍යාපෘතිය, සෞභාග්‍යා වැඩසටහන යටතේ ගෘහාශ්‍රිත එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය, ලෝක ආහාර සංවිධානයේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක වූ ආධාර වැඩසටහන හා යුනිසෙෆ් මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වූ පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන දැක්විය හැක. එමෙන්ම එයට අමතරව වන අලි හා මිනිස් ගැටුම් අවම කරනු වස් ක්‍රියාත්මක වූ විදුලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් මිනිස් ජීවිත හානි වීම හා ගොවි අස්වනු හානිය අවම කිරීම අපේක්ෂාව විය. තවද, "අලුත් ගමක් අලුත් රටක්"ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන පසුගිය වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස දැක්විය හැක.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවගේ ජීවනෝපාය සඳහා පිටුවහලක් වන අතරම සමාජ සුබසාධනය සහ පාරිසරික සංරක්ෂණය තහවුරු කිරීම අපේක්ෂාව විය. පැවති ආර්ථික අර්බුධ තත්ත්වය හා ජනතාව තුළ ඇතිව තිබූ ඉහළ අවිනිශ්චිතතාවය හමුවේ වුවද දිස්ත්‍රික්කයම ආවරණය වන ලෙස ක්‍රියාත්මක කරන ලද ඉහත සංවර්ධන ව්‍යාපෘති අදාළ ඉලක්ක සපුරාලන පරිදි සාර්ථකව ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය.

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20 ම ආවරණය වන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක වූ එළුවන් පාලනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් දිස්ත්‍රික්කයේ සත්ත්ව පාලන කටයුතුවල නිරත ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නංවන අතරම දිස්ත්‍රික්කයේ සත්ත්ව පාලන අංශයට දක්වන දායකත්වය ඉහළ නැංවීම අරමුණු විය. මෙම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 9.76 ක වියදමක් දරා පවුල් 129 ක් අතර එළුවන් 387 දෙනෙකු බෙදා දීම සිදු විය.

සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2023 (2023 දෙසැම්බර් 31 දිනට)

| # | ව්‍යාපෘතියේ නම | 2023 වසර සඳහා මුළු ප්‍රතිපාදන මුදල (රු.මිලියන) | ව්‍යාපෘති ගණන | මුළු වියදම (රු.මිලියන) |
|---|---|---|---|---|
| 1 | එළු පාලන ව්‍යාපෘතිය | 9.85 | 129 | 9.76 |
| 2 | ගෘහාශ්‍රිත එළු පාලනය මඟින් පවුලේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (සෞභාග්‍යා) | 25.63 | 1 | 25.63 |
| 3 | නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මිලියන 1.00) | 82.92 | 83 | 58.96 |
| 4 | නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මිලියන 0.6) | 50.94 | 85 | 37.59 |
| 5 | නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (අවිච්ඡේද 2021) | 0.21 | 8 | 0.11 |
| 6 | ධීවර සංවර්ධන ව්‍යාපෘතිය | 0.81 | 3 | 0.81 |
| 7 | විදුලි වැට සංවර්ධන ව්‍යාපෘතිය | 8.26 | 4 | 7.29 |
| **මුළු එකතුව** | | **178.67** | **313** | **140.14** |

තවද, ගෘහාශ්‍රිත එළු පාලනය හරහා පවුල්වල ආදායම් තත්ත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියක් සෞභාග්‍යා වැඩසටහන යටතේ ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය සඳහා කාන්තා, ළමා කටයුතු හා

සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය රුපියල් මිලියන 25.63 ක ප්‍රතිපාදන ලබා දුන් අතර, ග්‍රාමීය පවුල්වල ආදායම් තත්ත්වය ඉහළ නැංවීම තුළින් ග්‍රාමීය කාන්තාවන් ආර්ථිකව සවිබල ගැන්වීම මූලික අරමුණ විය.

**02. <u>“අලුත් ගමක් අලුත් රටක්” ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන</u>**

ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ජාතික ආර්ථිකය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන රජය විසින් “අලුත් ගමක් අලුත් රටක්” ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ ප්‍රධාන අංශයන් 08 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක විය. එනම්, ආර්ථික, සමාජීය දිළිදුකම පිටු දැකීම, සෞඛ්‍ය හා පෝෂණය, කෘෂිකාර්මික, පාරිසරික, රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් යන අංශයනුයි.

මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය මට්ටමේ කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම එක් එක් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම් අතර සිදුකළ අතර, දිස්ත්‍රික් ලේකම්තුමාගේ කාර්ය සාධන ගිවිසුම දිස්ත්‍රික් ලේකම්තුමා හා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් අතර සිදුවිය. ඒ අනුව 2023 වර්ෂයට අදාළව එම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

- ❖ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 438 ක් බිහි කිරීම
- ❖ කාර්මික හෝ කෘෂිකාර්මික අපනයන නිෂ්පාදන ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මක කිරීම.
- ❖ පාසල් හැර ගිය සිසුන් 983 ක් නැවත පාසල් වෙත යොමු කරවීම.
- ❖ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් 2771 ක් පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීම.
- ❖ නීති විරෝධී මත්ද්‍රව්‍ය වෙළදාමේ නිරත වූ පුද්ගලයින් 508 ක් පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීම.
- ❖ තිරසර ගෙවතු වගා 8845 ක් ආරම්භ කිරීම.
- ❖ ආර්ථිකව පීඩාවට පත් පවුල් 4801 ක ආර්ථික මට්ටම තිරසාරව ඉහළ නැංවීම.
- ❖ අඩු ආදායම්ලාභී ගර්භණී මාතාවන්ගේ දරු ප්‍රසූතිය තෙක් පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපෘති 3151 ක් ක්‍රියාත්මක කිරීම.
- ❖ කැපකරු මාපිය ක්‍රමය යටතේ අඩු ආදායම්ලාභී පවුල් 2965 ක දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
- ❖ පාරිසරික සංරක්ෂණය අරමුණු කර නැවත වන වගා කිරීමේ ව්‍යාපෘති 96 ක් ක්‍රියාත්මක කිරීම.

**03. <u>ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කරනුවස් කෘෂිකර්ම අංශයේ ක්‍රියාකාරීත්වය</u>**

රටෙහි පවත්නා ආර්ථික තත්ත්වය මත මහජනතාවට බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය. ඒ අනුව රැකියා අහිමි වීම, භාණ්ඩවල මිල ඉහළ යාම මත මිලදී ගැනීමේ හැකියාව පහළ යාම සහ සෞඛ්‍යාරක්ෂිත ආහාර ද්‍රව්‍ය සොයා ගැනීමේ හා පාරිභෝජනය කිරීමේ දුෂ්කරතාවය පෙන්වා දිය හැක. මෙවැනි හේතූන් මත බහුලව භාවිතා වන පළතුරු සහ එළවළු වර්ග දිස්ත්‍රික්කය තුළ සුලභ කිරීමේ අරමුණ ඇතිව, දිස්ත්‍රික්කයේ සියළු ගෘහ ඒකක ආවරණය වන පරිදි ගෙවතු වගා වැඩසටහන් ආරම්භ කිරීමට ජනතාව උනන්දු කිරීම සිදුකරන ලදී.

දිස්ත්‍රික්කයේ වගා කරනු ලබන ප්‍රධාන භෝගයන්හි ස්වයංපෝෂිතාව ළඟා කර ගැනීම අරමුණු කරගෙන වැඩි භූමි ප්‍රමාණයක් 2023 යල කන්නයේදී වගා කිරීම සඳහා ගොවීන් උනන්දු කිරීම සිදුකළ අතර එමඟින් හෙක්ටයාර 62525 ක භූමි ප්‍රමාණයක වී වගා කළ අතර ඉන් මෙට්‍රික් ටොන් 278972 ක වී අස්වැන්නක් ලබාගැනීමට හැකි විය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය ඉහළ නැංවීම පිණිස 2023 වර්ෂයේදී උඳු හා මුං වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ මුං බීජ කිලෝ ග්‍රෑම් 2960 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 ක ගොවීන් 582 ක් අතර බෙදා දුන් අතර එම ව්‍යාපෘතියේ සමස්ථ වියදම රුපියල් මිලියන 4.97 ක් විය. තවද, උඳු බීජ කිලෝ ග්‍රෑම් 107.5 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක ගොවීන් 26 දෙනෙකු අතර බෙදා දුන් අතර එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් නම් වශයෙන්, ආලයාඩිවෙම්බු, ඉරක්කාමම්,

අඩ්ඩාලච්චේන හා තිරුක්කෝවිල් විය. එම ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය රුපියල් මිලියන 0.10 ක් විය. එයට අමතරව 2023/24 මහ කන්නය සඳහා හෙක්ටයාර 79412 ක වී වගා කරනු ලැබීය. (මූලාශ්‍රය : දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර)

**04. <u>දිස්ත්‍රික්කයේ සහය අවශ්‍ය පුද්ගලයින් සඳහා දේශීය හා විදේශීය ආධාර වැඩසටහන් යටතේ සාර්ථකව ක්‍රියාත්මක වූ ව්‍යාපෘති</u>**

ලෝක ආහාර සංවිධානයේ මූල්‍ය සහයෝගීතාව මත ඉරක්කාමම්, නාවිදන්වේලි, නින්දවූර්, පොතුවිල්, සම්මන්තුර හා තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ආහාර සහයෝගීතා ව්‍යාපෘති ක්‍රියාත්මක විය. එම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

ලෝක ආහාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක ආහාර සහයෝගීතා ව්‍යාපෘතියේ ප්‍රගතිය (2023 දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත පවුල් සංඛ්‍යාව | බෙදාහරින ලද ආහාර ද්‍රව්‍ය | |
|---|---|---|---|---|
| | | | පරිප්පු (බෑග්) | එළවළුතෙල් (කෑන්) |
| 1 | ඉරක්කාමම් | 2791 | 2791 | 2791 |
| 2 | නාවිදන්වේලි | 2843 | 2843 | 2843 |
| 3 | නින්දවූර් | 2793 | 2793 | 2793 |
| 4 | පොතුවිල් | 5304 | 5304 | 5304 |
| 5 | සම්මන්තුර | 7280 | 7280 | 7280 |
| 6 | තිරුක්කෝවිල් | 3228 | 3228 | 3228 |
| **එකතුව** | | **24239** | **24239** | **24239** |

මීට අමතරව යුනිසෙෆ් සංවිධානයේ සහයෝගීත්වයෙන් දිස්ත්‍රික්කයේ පෙර පාසල් 380 ක දරුවන් 11,227 ක් සඳහා පෝෂණීය උදෑසන ආහාර වේලක් ලබා දෙන ලද අතර, ඒ සඳහා රුපියල් මිලියන 55.61 ක වියදමක් දරණ ලදී.

## <u>2023 වර්ෂයේ දී මුහුණ දුන් අභියෝග</u>

2023 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මුහුණ දුන් අතර, එම අභියෝග සාර්ථකව කළමනාකරණය කර ගැනීමට හැකි විය.

1. ආර්ථික අවපාතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවගේ පීඩන මට්ටම නගාසිටුවීම සඳහා මූලිකත්වය දීමේ රජයේ මූලික අපේක්ෂාව අනුව සමාජ සුභ සාධනය, කෘෂිකාර්මික සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා පුමුඛත්වය දීම හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සීමා වීම සිදුවිය.
2. 2023 වර්ෂය තුල දිස්ත්‍රික්කය මුහුණ දුන් නියං තත්ත්වය සහ ගංවතුර තත්ත්වය හේතුවෙන් ජනතාව දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අතර විශේෂයෙන් ගොවි ජනතාවට අස්වැන්න විනාශ වීම සහ ප්‍රවාහන දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය.
3. රටෙහි පැවති ආර්ථික අවපාතය හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාවටද බොහෝ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය. මේ යටතේ පෝෂණීය ආහාර වේලක් සපයා ගැනීමේ ගැටළුව ප්‍රධාන විය. එබැවින්, සහයක් අවැසි ජනතාවට සහය වීමට දේශීය හා විදේශීය ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ ඉතා හොඳින් සම්බන්ධීකරණ කටයුතු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සිදුවිය.

## 2024 වර්ෂය සඳහා සැලසුම්

දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය තහවුරු කිරීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, ගංවතුර වැනි ස්වභාවික ආපදා තත්ත්ව වලදී පත්වන අපහසුතා පිටු දැකීමට අවශ්‍ය සහය ලබා දීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහනදායී ආදායම් මට්ටමක් ළඟා කර ගැනීමට සහය දීම අරමුණු කර ගනිමින් පහත සඳහන් සැලසුම් 2024 වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. ඒ අනුව, 2024 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමස්ථ අරමුණ වනුයේ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන අතරම ප්‍රදේශයේ ජනතාවගේ යහපැවැත්ම තහවුරු කිරීමයි.

1. පෝෂණීය ආහාර සපයා ගැනීමේ අපහසුතාවයෙන් පෙලෙන ජනතාවගේ දෛනික පෝෂණ අවශ්‍යතා සැපයීම සඳහා ආහාර සුරක්ෂිතතා හා පෝෂණ වැඩසටහන් 2024 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
2. ග්‍රාමීය ජනතාවගේ පෝෂණීය ආහාර පරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා පමණක් නොව එළවළු හා ආහාර ද්‍රව්‍ය මිල අධික ලෙස ඉහල නැගීමෙන් සිදුවන අපහසුතා සඳහා සාර්ථකව මුහුණ දීමට හැකි වනු පිණිස තිරසර ගෙවතු වගා 3000 ක් නිර්මාණය කිරීමට අපේක්ෂිත වේ.
3. කෘෂි අංශයේ දිස්ත්‍රික් දායකත්වය ඉහළ නැංවීම සඳහා නවීන කෘෂි තාක්ෂණය භාවිතය, කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP) ක්‍රියාත්මක කිරීම තුළින් සිදුකිරීමට අපේක්ෂිත වේ.
4. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මඟින් අඩු ආදායම්ලාභී පවුල්, කාන්තාවන් හා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමට අපේක්ෂිතය.
5. දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා උපරිම දායකත්වය ලබා ගැනීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිගැන්වීමට අපේක්ෂිත අතර ඒ යටතේ කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින් 133 ක් නිර්මාණය කිරීමටද, කාර්මික හා කෘෂිකාර්මික අපනයන නිෂ්පාදන ව්‍යාපෘති 21 ක් ඇති කිරීමටද අපේක්ෂිතය.
6. ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණදී ඇති පවුල් 718 ක් සඳහා විශේෂ අවධානයක් යොමු කර තිරසර ආර්ථික ප්‍රවේශයක් මඟින් ඔවුන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.
7. අත්හැර දමන ලද ඉඩම් කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීම සහ ඉඩම් අවභාවිතය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තුළින් දිස්ත්‍රික්කයේ පවත්නා ඉඩම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කිරීම.
8. දිස්ත්‍රික්කය තුළ පරිසර සංරක්ෂණය තහවුරු කිරීම උදෙසා නැවත වන වගා කිරීමේ ව්‍යාපෘති 48 සිදුකිරීමට අපේක්ෂිතය.
9. ගොවීන්ගේ අස්වැන්න ආරක්ෂා කිරීමේ අරමුණ හා මිනිස් ජීවිත මෙන්ම අලින්ගේ ජීවිත ද ආරක්ෂා කිරීමේ අරමුණෙන් පවත්නා විදුලි වැටවල් තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂිතය.
10. දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අංශයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට හා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය. මේ යටතේ විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල ගර්භණී මව්වරුන්ගේ හා ළමයින්ගේ සෞඛ්‍ය හා පෝෂණ අවශ්‍යතා සැලකිල්ලට ගැනීමට නියමිතය. ඒ අනුව අඩු ආදායම්ලාභී ගර්භණී මව්වරුන්ගේ දරු ප්‍රසූතිය දක්වා පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් 1337 ක් ද අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 1082 දෙනෙකුගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා කැපකරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.
11. 2024 වර්ෂය තුළදී පාසල් හැර ගොස් සිටින දරුවන් 469 දෙනෙකු නැවත පාසල් වෙත යොමු කරවීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.
12. දෙමාපිය රැකවරණය අහිමි වූ දරුවන්ගේ සුබසාධනය සඳහා විකල්ප රැකවරණ සේවාවක් සැපයීමට මුල පිරීමට අපේක්ෂිතය.
13. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් 448 ක් පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂා කෙරේ.

චින්තක අබේවික්‍රම,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.
Email - distsecampara@gmail.com
Fax - 063-2222130

## 03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ -1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 8,048,561,656 | 4,929,631,000 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 1,136,086,512 | 502,211,204 | ඒසීඒ -4 |
| 70,000,000 | අත්තිකාරම් ගිණුම් | | 69,413,731 | 64,040,672 | ඒසීඒ -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | 19,505 | |
| 70,000,000 | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **9,254,061,899** | **5,495,902,381** | |
| 70,000,000 | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **9,254,061,899** | **5,495,902,381** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 512,000,000 | 43,642,547 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **8,742,061,899** | **5,452,259,834** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1,344,075,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,286,117,782 | 1,069,390,882 | |
| 268,831,465 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 230,658,091 | 169,038,058 | ඒසීඒ -2(ii) |
| 3,094,100,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 3,002,448,094 | 3,498,914 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 3,993,535 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 3,993,535 | - | |
| 4,711,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **4,523,217,502** | **1,241,927,854** | |
| | **මූලධන වියදම්** | | | | |
| 31,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 23,668,225 | 19,564,612 | |
| 37,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 35,609,488 | 27,942,223 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ -2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 2,500,000 | හැකියා වර්ධනය | 14 | 1,392,510 | 763,410 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | 459,836,461 | |
| 71,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **60,670,223** | **508,106,706** | |
| | තැන්පතු ගෙවීම් | | 1,144,057,460 | 588,271,350 | ඒසීඒ -4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 68,798,069 | 66,190,570 | ඒසීඒ -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | 21,505 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **1,212,855,529** | **654,483,425** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 5,796,743,254 | 2,404,517,984 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 2,945,318,645 | 3,047,741,850 | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 2,945,318,645 | 3,047,741,850.00 | ඒසීඒ -7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ -3 |
| | | | 2,945,318,645 | 3,047,741,850 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2023 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | | | |
|---|---|---|---|
| | | තත්‍ය | |
| | සටහන | 2023 | 2022 |
| | | රු. | රු. |
| <u>**මූල්‍ය නොවන වත්කම්**</u> | | | |
| දේපළ , පිරියත හා උපකරණ | ඒසීඒ -6 | 7,392,945,924 | 3,718,140,211 |
| <u>**මූල්‍ය වත්කම්**</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5/5(ඒ) | 203,229,604 | 203,845,266 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | - | - |
| **මුළු වත්කම්** | | **7,596,175,528** | **3,921,985,477** |
| <u>**ශුද්ධ වත්කම් / ස්කන්ධය**</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 131,635,733 | 124,280,447 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 7,392,945,924 | 3,718,140,211 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>**ජංගම වගකීම්**</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ -4 | 71,593,871 | 79,564,819 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | - | |
| **මුළු වගකීම්** | | **7,596,175,528** | 3,921,985,477 |

පිටු අංක 07 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 29 සිට 68 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ................... | ............................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| ප්‍රදීප් යසරත්න | චින්තක අබේවික්‍රම | එස්.එල් ආදම්බාවා |
| ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම්,අම්පාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| දිනය :2024.02. 26 | දිනය :2024.02. | දිනය :2024.02. 17 |
| ප්‍රදීප් යසරත්න<br>ලේකම්<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>(ස්වදේශ කටයුතු අංශය)<br>"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05. | චින්තක අබේවික්‍රම<br>දිස්ත්‍රික් ලේකම් / දිසාපති,<br>අම්පාර දිස්ත්‍රික්කය | එස්.එල්. ආදම්බාවා<br>ප්‍රධාන ගණකාධිකාරි<br>අම්පාර දිසාපති වෙනුවට |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සතය | |
|---|---|---|
| | **2023**<br>රු. | **2022**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර , දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 735,842,291 | 282,451,089 |
| අග්‍රිම ලැබීම් | 8,048,561,656 | 4,929,631,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 91,018,522 | 85,305,672 |
| තැන්පතු ලැබීම් | 1,136,086,512 | 502,211,204 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **10,011,508,981** | **5,799,598,965** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,509,011,478 | 1,237,114,945 |
| සහනාධාර සහ මාරුකිරීම් | 3,006,441,629 | 3,498,914 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,683,786,208 | 3,324,266,700 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 512,000,000 | 43,642,547 |
| අත්තිකාරම් ගෙවීම් | 95,541,984 | 94,697,803 |
| තැන්පතු ගෙවීම් | 1,144,057,460 | 588,271,350 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **9,950,838,758** | **5,291,492,259** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **60,670,223** | **508,106,706** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 60,670,223 | 508,106,706 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **60,670,223** | **508,106,706** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(60,670,223)** | **(508,106,706)** |
| **ඇ) + (ඊ)** | **(0)** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | 508,106,706 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **508,106,706** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **(508,106,706)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒසිඒ - 1

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි :දිස්ත්‍රික් ලේකම්

වියදම් ශීර්ෂ අංකය : 270

රු.

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | සටහන | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම් (2) | | | (3) | ආදායමෙන් ආපසු ගෙවීම් (4) | | | (5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූලික ඇස්තමේන්තුව 1(i) | සංශෝධිත ඇස්තමේන්තුව 1(ii) | අදාළ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම් 2(i) | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21) 2(ii) | එකතුව 2(iii)=2(i) +2(ii) | හිඟ ආදායම් රැස්කිරීම් (3) | මුදලින් 4(i) | වැරදි නිවැරදි කිරීම් 4(ii) | එකතුව 4(iii)=4(i)+ 4(ii) | ශුද්ධ ආදායම 5=2(iii)+( 3)-4(iii) |
| | අදාල නොවේ. | | | | | | | | | | | |
| | මුළු එකතුව | | | | | | | | | | | |

ප්‍රධාන ගණකාධිකාරි
එස්.එල් ආදම්බාවා
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර
දිනය :2024.02. 17

ආදායම් ගණන්දීමේ නිලධාරි
චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්,අම්පාර
දිනය :2024.02. 17

එස්.එල්. ආදම්බාවා
ප්‍රධාන ගණකාධිකාරි
අම්පාර දිසාපති වෙනුවට

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය**

(ඊ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම හතරකට අදාළ ආරම්භක ශේෂය රු.3,718,140,210 ක් වුවද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම හතරට අදාළ ආරම්භක ශේෂය රු.7,417,865,709කි. ඒ අනුව, වාර්තා දෙකෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් අතර රු.3,699,725,499ක වෙනස්කමක් පැවතුණි.

(උ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.35,609,488ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ - (SA82) එය රු.35,474,687ක් වූයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර පොත් අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකමෙහි රු.134,801ක වෙනසක් පැවතුණි.

(ඌ) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භුක්ති විඳිනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම ඇතුළු ඉඩම් කැබලි 68 ක අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවරාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.5 තැන්පතු ගිණුම් ශේෂ

භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුම් වාර්තාවේ (SA30) ඇතුළත් තැන්පතු ගිණුම්වල ඉකුත් වර්ෂය අවසානයට දක්වා ඇති ශේෂය රු.79,564,819ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ශේෂය රු.228,408,294ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ආරම්භක ශේෂය අතර රු.148,843,475ක වෙනසක්මක් පැවතුණි.

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වියදම් අයිතම පහක් යටතේ සම්පාදනය කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 10 සිට සියයට 73 දක්වා වූ ප්‍රතිපාදන අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන ඉතිරි කර තිබුණි. ඒ අනුව නිවැරදිව ඉදිරි වියදම් පුරෝකථනය කරමින් අයවැය ලේඛනය සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය හා පසුගිය වසර 04 සලකා බැලීමේ දී වැය විෂය අංක 270-1-0-2401 යටතේ සියයට 44කට වඩා වැඩි මුදලක් ඉතිරි කර ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ද පසුගිය වර්ෂවල ප්‍රතිපාදන භාවිතය පිළිබඳ සැලකිල්ලට ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති චක්‍රලේඛය අනුව වැය විෂය සංකේතාංක 1003 - වෙනත් දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන අවම වශයෙන් සියයට 06ක ප්‍රතිශතයක් ඉතිරි කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉතිරි කර තිබුණේ සියයට 05ක ප්‍රතිශතයක ප්‍රතිපාදන බව නිරීක්ෂණය විය.

#### 2.1.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

**(අ) කර්මාන්ත අමාත්‍යාංශය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2023 දෙසැම්බර් 22 දින අම්පාර නවගම්පුර කර්මාන්තපුරයේ වැට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.2,750,000ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද කාලය ප්‍රමාණවත් නොවීම මත එම කටයුත්ත ඉටු නොකර ප්‍රතිපාදන ආපසු අදාළ අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

(ආ) බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.29,000,000ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද 2021 වර්ෂය වන විට රු.16,695,573ක් වියදම් කරමින් ඉදිකර තිබුණු එම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශය

අඩු ආදායම්ලාභීන් සඳහා වන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යටතේ නින්දවූර්, කල්මුණ හා අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත ලබා දී තිබූ රු.152,100 ක් වටිනා මිය ගොස් තිබුණු එළුවන් හයදෙනෙකු සඳහා රක්ෂණ වන්දි ලබා ගෙන නොතිබුණු අතර සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ප්‍රතිලාභීන් තුන්දෙනෙකු වෙත ලබා දී තිබූ එළුවන් අටදෙනෙකු මිය යාම හේතුවෙන් ලබාගෙන තිබූ රු.71,740ක රක්ෂණ වන්දි මුදලින් නැවත එළුවන් මිල දී ගෙන නොතිබුණි.

(ඈ) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

(i) ග්‍රාම ශක්ති වැඩසටහන

- ග්‍රාම ශක්ති වැඩසටහන 2018 සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ග්‍රාම ශක්ති සමිති සාමාජිකයන් වෙත ලබා දෙන ලද රු.132,202,409ක ණය මුදලකින් රු.79,784,715ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොතිබුණි.

- ඉහත වැඩසටහන සම්බන්ධයෙන් සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මඟින් නිකුත් කරන ලද අංක SDB/SPV/GS/2022/චක්‍රලේඛ 01 හා 2022 ජුනි 28 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සක්‍රීයව පවතින ග්‍රාම ශක්ති මව් සමිතිවල පවතින මුදල් උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් සඳහා, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සහ සමිති සාමාජිකයන් සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා වන ව්‍යාපෘති සඳහා යොදාගත හැකි වුවද අම්පාර දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි සමිති 244 ක් අතරින් සක්‍රීයව පවතින සමිති 138 ක් චක්‍රලේඛය අනුව එම අරමුදල් භාවිතා නොකර තම බැංකු ගිණුම්වල එකතුව රු.29,576,689ක මුදලක් නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. තවද ලියාපදිංචි මුළු සමිති අතරින් 2023 වර්ෂය වන විට සමිති 106 ක් අක්‍රීයව පැවති අතර ඒවායේ බැංකු ගිණුම් තුළ රු.7,923,492ක මුදලක් රඳවාගෙන තිබෙන බව ද නිරීක්ෂණය විය.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 චක්‍රලේඛයේ 2.iv වගන්තිය | | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද නියැදි විගණන පරීක්ෂාව අතර මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් වෙත 2023 වර්ෂය සඳහා එලෙස ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමකින් තොරව අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 | 3,437,826 | අඩ්ඩාලච්චේන හා තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණික කමිටු නිර්දේශය නොමැතිව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාශයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 05ක කාලයක සිට රඳවාගෙන තිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

(අ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ලබා දී තිබූ LO – 2943 දරන ලොරි බවුසරය 2022 අප්‍රේල් 26 දින සිට ධාවනය නවතා ඇති අතර එය අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම රථය ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ අනාරක්ෂිතව ගාල්කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ ලියාපදිංචි සහතික නොමැති, අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි අංක RA – 3273 දරන ට්‍රැක්ටර් රථය 2018 වර්ෂයේ සිට ධාවනය කිරීමට නොහැකි වීම හේතුවෙන් කාර්යාල භූමියේ ගාල්කර තිබුණි. එම රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ලබා දී තිබූ අංක 153 – 8849 දරන යතුරුපැදිය ලියාපදිංචි සහතික නොමැති බැවින් අයිතිය තහවුරු කරගත නොහැකි වී තිබූ අතර 2012 වර්ෂයේ සිට ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවතුනි. එම යතුරුපැදිය අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අංක 43-3136 දරන වතුර බවුසරය 2013 වර්ෂයේ සිට වසර 10 ක පමණ කාල සීමාවක් භාවිතයට ගැනීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ගාල්කර ඇති අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පැවති ස්වේච්ඡා සංවිධානයක් වෙත රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් ලබා දී තිබූ සංයුක්ත කොළ මඩින යන්ත්‍ර දෙකක්, ට්‍රැක්ටරයක් හා ටේලරයක් එම ස්වේච්ඡා සංවිධානයේ ආරවුලක් හේතුවෙන් 2012 වර්ෂයේ දී මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නොතිබුණු අතර අදාල වාහන හා යන්ත්‍ර මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 22කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාර දී තිබුණත්, එය අලුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා යතුරු පැදි 10ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 04කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි.

**3.3 පාඩු හා හානි**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණ ද 2024 මැයි 07 දින වන විටත් ඒ පිළිබඳව ඉදිරි පියවර ගෙන නොතිබුණි.

**3.4 අනාර්ථික ගනුදෙනු**

(අ) 2022/ 2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ වී මෝල් හිමියන් හරහා මිලදී ගන්නා ලද වී තොග සහල් කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හරහා නියෝග ලබාදීම සිදු නොවීම මත අදාළ කාර්යය සඳහා භාවිතයට ගැනීමකින් තොරව ආසන්න වශයෙන් රු.41,848,330ක වටිනාකමකින් යුතු සහල් කිලෝග්‍රෑම් 389,546ක ප්‍රමාණයක් 2023 අගෝස්තු 21 විගණිත දින වන විටත් මිනිස් පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයට පත් වී තිබුණි. නියැදි විගණන පරීක්ෂණ අනුව එම පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයට පත්ව තිබූ සහල් ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 158,736ක් විගණිත දින වන විටත් විධිමත් අධීක්ෂණයකින් තොරව වෙළෙඳපොල වෙත නිකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) **පරිපාලන වියදම් ගෙවීම**

(i) 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න් 1% ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සත්‍ය වශයෙන් දරන ලද

වියදම නොසලකා හැර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාල නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර තිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව මෙම වැඩසටහන 2023 මාර්තු හා අප්‍රේල් මාස තුල දී අවසන් විය යුතු වුවද 2023 අගෝස්තු 08 දින වන විටත් අදාල ගබඩාවන් තුළ ඉතිරිව තිබූ සහල් කිලෝග්‍රෑම් 420,546 ක් හා වී කිලෝග්‍රෑම් 8,779,903 ක තොග සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබිය දී ඒ සම්බන්ධ පරිපාලන වියදම් ලෙස ඉහත සඳහන් මුදල නිලධාරීන් වෙත ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(iii) නියැදි විගණන පරීක්ෂණය අනුව උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිපාලන වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ඉහත සඳහන් කමිටු තීරණය මත එක් එක් නිලධාරියාගේ මූලික වැටුපෙන් ¼ ක දීමනාවට අමතරව නිවාඩු දින වැටුප්, ගමන් වියදම් හා අතිකාල දීමනා වශයෙන් ද රු.367,181ක් නිලධාරීන් 16 දෙනෙකු වෙත ගෙවීම් කර තිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

### (අ) අතිකාල දීමනා ගෙවීම්

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වියදම් පාලනය සඳහා අවශ්‍යතාවය මත පමණක් අතිකාල දීමනා ගෙවීම් කළ යුතු වුවද අඩ්ඩාලච්චේන හා කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අනුමත කාර්යය මණ්ඩලය අනුව සංවර්ධන නිලධාරි හා කළමනාකරණ සේවා නිලධාරීන් 134 ක අතිරික්තයක් පැවතිය ද ඔවුන් අතර නිවැරදි වැඩ බෙදීමක් සිදු වී නොමැතිවීම මත 2023 වර්ෂය සඳහා නිලධාරීන් 35 දෙනෙකු වෙත රු.1,012,564 ක අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි.

(ආ) **2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන**

2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් වී මිලදීගෙන අඩු ආදායම්ලාභීන් වෙත සහල් ලබා දීමෙන් අනතුරුව සහල් මෝල් හිමියන් භාරයේ පැවති රජයේ වී තොග සහල් කර අලෙවි කිරීම සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 ජූලි 17 දිනැති හා අංක DFD/MD/GPPP/PD/Maha/2022/23 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඉතිරි වී තොග සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් මස සිදුකරන ලද පළමු ටෙන්ඩරය අනුව තෝරාගත් ගැනුම්කරු හට සහල් අලෙවිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක් යටතේ තෝරාගෙන තිබූ වී මෝල් 24 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබූ රු.170,122,703ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,226,373ක් 2024 මැයි 20 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **දීර්ඝ කාලීන බදු අයකිරීම**

(i) දමන, අක්කරපත්තු හා කල්මුණ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුවලට අදාළව රු.24,538,440ක බදු මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි. මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුහිමි පුද්ගලයින් 09 දෙනෙකු විසින් වාණිජ පදනම මත ලබා දී ඇති බදු ඉඩම් නේවාසික කටයුතු සඳහා ද භාවිතා කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(iii) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීන බදු පදනමින් පෞද්ගලික ව්‍යාපාරිකයෙකු හට පර්චස් 80ක ඉඩම් කැබැල්ලක් සඳහා ලබා දී තිබූ බදු ගිවිසුම 2021 වර්ෂයේ කල් ඉකුත් වී තිබුණු අතර එම බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව විගණිත දිනය වන 2023 දෙසැම්බර් 31 දින වන විටත් පැරණි ගිවිසුම ප්‍රකාරව වර්ෂයකට රු.3,037 බැගින් පමණක් බදු අයකර ගෙන තිබුණි.

(iv) අඩ්ඩාලච්චේන, පොතුවිල්, නින්දවූර් හා අක්කරෙයිපත්තුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් රජයේ ඉඩම් කැබලි 17ක අනවසරයෙන් ඉන්ධන පිරිවුම්හල්, සංචාරක හෝටල් ආදිය කර්මාන්ත පවත්වා ගෙන ගොස් තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඊට වගකිව යුතු ආයතන විසින් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

(අ) 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2364 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2945 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 81ක් පුරවා ගැනීමට හා 662 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ 6 වන වගන්තිය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ දී පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අනුව ක්‍රියාත්මක කළ යුතු පුහුණු වැඩසටහන් සැලසුම් කර නොමැති වීම හේතුවෙන් වර්ෂයේ ප්‍රතිපාදන මුදලින් රු.1,107,490ක් ඉතිරිව පැවති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**

**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| **නිශ්චිත දර්ශකය** | **සත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස** | | | |
|---|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** | **0%-49%** |
| යටිතල පහසුකම් සංවර්ධනය | 94 | - | - | - |
| ක්‍රියාත්මක කළ සමාජ සුභ සාධන කටයුතු | 100 | - | - | - |
| ජීවනෝපාය සංවර්ධනය | 100 | - | - | - |
| පරිසර අංශයේ සංවර්ධනය | 100 | - | - | - |

## 05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීම.

### 5.1 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය

| | ඉලක්ක / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණය පිළිබඳ දර්ශක | අද දක්වා ජයග්‍රහණවල ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 1 | සෑම දෙසකම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳුකම නිමා කිරීම. | විවිධ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන සම්පත් සැලකිය යුතු ලෙසත් බල මුළු ගැන්වීම | i) දිස්ත්‍රික්කයේ පවුල් 129 ක් අතර එළුවන් 387 ක් බෙදා දීම.<br>ii) සෞභාග්‍යා වැඩසටහන යටතේ රුපියල් මිලියන 25.63 ක වියදමින් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එළුවන් පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.<br>iii) ආර්ථික අපහසුතාවයන්ගෙන් පෙළෙන පවුල් 4801 ක ආර්ථික තත්ත්වය, තිරසර ලෙස ඉහල නැංවීම. | | | 100 |
| 2 | සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 2030 වන විට දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සහ නිසි මැදිහත්වීම් කරන අතරම ගොවීන්, ධීවරයින් සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ කෘෂිකාර්මික ඵලදාව සහ ආදායම දෙගුණ කිරීම | i) අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18ක අක්කර 296 ක් ආවරණය වන පරිදි මුං වගා ව්‍යාපෘතියක් සිදුකිරීම.<br>ii) අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක අක්කර 10.75 ක් ආවරණය වන පරිදි උඳු වගා ව්‍යාපෘතියක් සිදු කිරීම.<br>iii) තිරසර ගෙවතු වගා 8845 ක් ආරම්භ කිරීම<br>iv) කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP) යටතේ කටු අනෝදා සහ බඩඉරිඟු වැනි වගාවන් නවීන සහ තිරසර කෘෂිකාර්මික තාක්ෂණයන් යොදා ගනිමින් සිදු කිරීම.<br>v) ලෝක ආහාර සංවිධානයේ පරිත්‍යාග මත ලද පරිප්පු බෑග් 24239ක් හා එළවළු තෙල් කෑන් 24239 ප්‍රතිලාභීන් 24239 ක් අතර බෙදා දීම.<br>vi) යුනිසෙෆ් සංවිධානයේ සහයෝගීතාව මත රුපියල් මිලියන 55.61 ක පිරිවැයක් දරා දිස්ත්‍රික්කයේ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පෙර පාසල් 380 ක දරුවන් 11227 ක් සඳහා පෝෂ්‍යදායී උදෑසන ආහාර වේලක් ලබා දීම. | | | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | නිරෝගීමත් ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම | නිසි පෝෂණය සැපයීම මඟින් වසර 2030 වන විට නොමේරු ළදරු මරණ අවම කිරීම හා ළමා සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම. | i) පෝෂණ අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී ගර්භණී කාන්තාවන්ගේ පෝෂණ මට්ටම දරු ප්‍රසූතිය දක්වා හොඳින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අයත්වන වැඩසටහන් 3,151 ක් ක්‍රියාත්මක කර ඇත.<br>ii) අඩු අදායම්ලාභී පවුල්වල දරුවන් 2965 ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා කැපකරු වැඩසටහන් ආරම්භ කර එහි ප්‍රතිලාභ දරුවන් වෙත ලබා දීම. | | | 100 |
| 4 | සමානාත්මතාවයෙන් හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදා කර දීම. | වසර 2030 වන විට අඩු වයසින් පාසල් හැර යාම තුරන්කරලීම සහ දිස්ත්‍රික්කයේ ජීවත්වන සෑම අයෙකුගේම අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම. | i) 2023 වර්ෂයේදී පාසල් හැර ගිය දරුවන් 983 ක් පමණ නැවත පාසල් වෙත යොමු කිරීම.<br>ii) දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන සෑම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමකදීම දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, පළාත් මට්ටමේ නිලධාරීන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් සමඟ පාසල් සම්බන්ධයෙන් ඇති වී ඇති ගැටළු පිළිබඳව හා ගුරුවරුන්, දරුවන් සම්බන්ධව ඇති වන ගැටළු පිළිබඳව සාකච්ඡා කර සුදුසු විසඳුම් ලබා දී අධ්‍යාපනයේ ගුණාත්මක භාවය හා පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම. | | | 100 |
| 5 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියලු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම | ස්ත්‍රී පුරුෂ සාමානාත්මතාවය තහවුරු කිරීම සහ දිස්ත්‍රික්කයේ සියළුම කාන්තාවන් හා දැරියන් සවිබල ගැන්වීම. | i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වනිතා සංවර්ධන නිලධාරිණිය හරහා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු වෙනත් අදාළ නිලධාරීන් මඟින් (උදා:- සමාජ සේවා නිලධාරීන් හරහා) කාන්තාවන් හා ගැහැණු දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ කාන්තාවන් හා ගැහැණු දරුවන් සම්බන්ධ ගැටළු විසඳීම.<br>ii) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේදී කාන්තා මූලික ව්‍යවසායන් කෙරෙහි අදාළ නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම. | | | 100 |
| 6 | පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව | වසර 2030 වන විට සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම සහ තිරසර කළමනාකරණය ළඟා කර ගැනීම | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල් 5 ක හා දහම්පාසලක සනීපාරක්ෂක ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කිරීම. | | | 100 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **7** | නිසි කාර්යය ප්‍රවර්ධනය හා ආර්ථික වර්ධනය | ධරණීය, සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය සැමට පූර්ණ සහ ඵලදායී රැකියා හා නිසි කාර්යය ප්‍රවර්ධනය | වනිතා සංවර්ධන නිලධාරිණිය, විදාතා නිලධාරීන්, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් සමඟ එක්ව තමන්ගේම ව්‍යාපාර අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපිරීමට අවස්ථාව සැලසීම අරමුණු කොට විවිධ පුහුණු හා තොරතුරු වැඩසටහන් රැසක් පවත්වන ලදී. | | | 100 |
| **8** | කාර්මිකරණය, නව්‍යකරණය හා යටිතල පහසුකම් ගොඩනැගීම. | ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරි ගැන්වීම. | i) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 438 ක් බිහිකර ඇත.<br>ii) කාර්මික හා අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මක කරන ලදී. | | | 100 |
| **9** | අසමානතාවන් අවම කිරීම | රටවල් තුළ හා රටවල් අතර පවතින අසමානතා අවම කිරීම. | i) මේ යටතේ රජයේ විශේෂ සහන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන "අස්වැසුම" වැඩසටහන යටතේ විශේෂයෙන් හඳුනාගත් දරිද්‍රතා මට්ටම පහළ මට්ටමේ සිටින පුද්ගලයින් සඳහා ආර්ථික සහන සපයා ඇත.<br>ii) අධිකර, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ඒකාබද්ධ ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති (ආන්තීකරණයට ලක්වූ කාන්තා මූලික පවුල් ආර්ථිකව සවිබල ගැන්වීම, ආන්තීකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම හා පුනරුත්ථාපනය වූ පුද්ගලයින් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිට පුනරුත්ථාපනය වූ තරුණ තරුණියන් සහ ජීවනෝපාය සංවර්ධනය) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සෑම වර්ෂයකදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුකරනු ලබයි.<br>iii) මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූ පුද්ගලයින් 2771 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදාගෙන පුනරුත්ථාපනය කර සමාජගත කරන ලදී. | | | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **10** | තිරසර නගර හා ප්‍රජාවන් | නගර හහා ජනාවාස සංයුක්ත, සුරක්ෂිත, ස්ථායී සහ තිරසර කරලීම. | i) නැවත පදිංචිකිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ (රුපියල් මිලියනයේ නිවාස) රුපියල් මිලියන 58.96 ක් වැය කර නිවාස 83 ක් නිම කරන ලදී.<br>ii) නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ (රුපියල් ලක්ෂ 6 නිවාස) රු.මිලියන 37.59 ක් වැය කර නිවාස 85 ක් නිම කර ඇත. | | | 100 |
| **11** | තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් සහතික කිරීම | 2030 වන විට දිස්ත්‍රික්කයේ ජනතාව තිරසර පාරිභෝජන හා නිෂ්පාදන රටාවකට අනුගත වීම තහවුරු කිරීම. | i) දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය, අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අදාළ වෙනත් ආයතන මඟින් කෘෂිකාර්මික අස්වනු හානි අවම කිරීම සම්බන්ධව ගොවීන් හා නිෂ්පාදකයින් දැනුවත් කිරීම සිදුකරයි. | | | 100 |
| **12** | දේශගුණික විපර්යාස හා සම්බන්ධ කටයුතු | දේශගුණික විපර්යාස හා එහි බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. | i) 2023 දෙසැම්බර් - 2024 ජනවාරි කාලවකවානුවේදී ඇති වූ ගංවතුර තත්ත්වය හමුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා පොලිසිය, යුධ හමුදාව හා අනෙකුත් වගකිය යුතු නිලධාරීන් එක්ව ගංවතුරෙන් විපතට පත් ජනතාවට සහන සැලසීමට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී.<br>ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ජල පෝෂක හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) හා CResMPA ව්‍යාපෘතිය යටතේ වැව් අලුත්වැඩියා හා ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. | | | 100 |
| **13** | ජලය යට ජීවය | තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය | i) මේ යටතේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සමුද්‍රීය පරිසරය හා වෙරළාසන්න පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමටත්, ධීවර සම්පත් හරහා රටට හිමිවන ආර්ථික ප්‍රතිලාභ සංවර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති සිදුකරනු ලබයි. | | | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **14** | ගොඩබිමේ ජීවය | භෞමික පාරිසරික පද්ධතීන් සුරක්ෂිත කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ඉඩම් හායනය වළක්වා ප්‍රතිවර්තනය කිරීම සහ ජෛව විවිධත්ව විනාශය නවතාලීම. | පාරිසරික සංරක්ෂණය අරමුණු කරගෙන වන වගා ව්‍යාපෘති 96 ක් ක්‍රියාත්මක කරන ලදී. | | | 100 |
| **15** | සාමය, යුක්තිය හා සවිමත් ආයතන | තිරසර සංවර්ධනය පරිසර හිතකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය, යුක්තිය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායී, වගවීම් සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම. | i) මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් 2771 ක් ඉන් මුදවාගෙන පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීම.<br>ii) නීති විරෝධී මත්ද්‍රව්‍ය වෙළදාමේ නිරතවූ පුද්ගලයින් 508 ක් ඉන් මුදවා ගෙන පුනරුත්ථාපනය කිරීම.<br>iii) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 2965 සඳහා කැපකරු ක්‍රමයක් ක්‍රියාත්මක කර ඔවුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම. | | | 100 |
| **16** | ඉලක්ක සඳහා සහයෝගීතාවය | තිරසර සංවර්ධනය සඳහා වන්නාවූ ගෝලීය සහයෝගීතා ක්‍රියාදාමය සවිමත් කිරීම හා පුනර්ජීවය | i) පරිසර හිතකාමී තාක්ෂණය භාවිතයෙන් නව නිෂ්පාදන ඇති කිරීම සඳහා පුද්ගලයින් උනන්දු කරවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>ii) ප්ලාස්ටික් සහ පොලිතීන් වෙනුවට වන මැටි, වේවැල් ආදී ස්වභාවික ද්‍රව්‍ය යොදා ගනිමින් පරිසර හිතකාමී නිෂ්පාදන සිදුකිරීමට ග්‍රාමීය ව්‍යවසායකයන්ට දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ එක්ව මඟපෙන්වන ලදී. | | | 100 |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න.**

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය.

1. ආර්ථික අවපාතයෙන් පීඩාවට පත් ජනතාව වගා සිටුවීමේ අරමුණ පෙරදැරිව රජය විසින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අවම කර සමාජ සුභසාධන, කෘෂිකාර්මික හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය දීම.

2. අත්‍යාවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණ සපයා ගැනීමේ අපහසුතාව

3. ගංවතුර සහ නියං තත්ත්වය වැනි පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දිස්ත්‍රික්කයේ ගොවීන් ඇතුළු ජනතාවට ගමනාගමන අපහසුතාවයන්ට හා අස්වැන්න හානි වීම වැනි දුෂ්කර තත්ත්වයන්ට මුහුණදීමට සිදුවීම.

4. රටෙහි පැවති ආර්ථික අවපාතය යටතේ දිස්ත්‍රික්කයේ ජනතාවට ආදායම් තත්ත්වය අඩුවීම, පෝෂ්‍යදායී ආහාර සපයා ගැනීමේ අපහසුව, දෛනික අවශ්‍යතා සපුරා ගැනීමේ අපහසුතාව ආදි දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුවිය.

කෙසේ වෙතත් ඉහත සියළු බාධක, අභියෝග මධ්‍යයේ වුව ද බලාපොරොත්තු වූ ඉලක්ක පසුරා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| # | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්තය) | |
|---|---|---|---|---|
| | | | ඇබෑර්තු | අතිරික්තය |
| ජ්‍යෙෂ්ඨ | 98 | 80 | 18 | - |
| තෘතීයික | 77 | 40 | 37 | - |
| ද්විතියික | 1933 | 2595 | - | 662 |
| ප්‍රාථමික | 256 | 230 | 26 | - |
| එකතුව | **2364** | **2945** | **81** | **662** |

### 06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

බහු කාර්ය සංවර්ධන සහායකයින් හා සේවා පුහුණු ලාභීන් මගින් ද්විතියික හා ප්‍රාථමික නිලධාරීන්ගේ කාර්යයන් සිදුකර ගැනීම මගින් ආයතනයේ කාර්ය සාධනය පවත්වා ගැනීම කටයුතු කර ඇත.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1. | රාජ්‍ය නිලධාරීන් සඳහා ආකල්ප සංවර්ධන එක් දින පුහුණු වැඩමුළුව (දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන්) | 101 | 2023.04.28 | 105,230.00 | | දේශීය | හොඳයි |
| 2. | රාජ්‍ය නිලධාරීන් සඳහා ඉඩම් විෂය පිළිබඳ තෙදින පුහුණු වැඩමුළුව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි ඉඩම් කටයුතු රාජකාරී සඳහා මුදා හැර සිටින රාජ්‍ය කළමනාකරණ සේවා/සංවර්ධන නිලධාරීන්) | 40 | 2023.06.01<br>2023.06.01<br>2023.06.02 | 116,830.00 | | දේශීය | හොඳයි |
| 3. | රාජ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන (දිස්ත්‍රික් ලේකම් කාර්යාල කළමනාකරණ සේවා / සංවර්ධන නිලධාරීන්) | 42 | 2023.10.24 | 14,350.00 | | දේශීය | හොඳයි |
| 4. | නවක කාර්යාල කාර්ය සහයක නිලධාරීන් සඳහා වන පුහුණුව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි නවක කාර්යාල සේවක සේවයේ නිලධාරීන්) සිංහල මාධ්‍ය | 40 | 2023.12.07 | 55,605.00 | | දේශීය | හොඳයි |
| 5. | නවක කාර්යාල කාර්ය සහයක නිලධාරීන් සඳහා වන පුහුණුව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි නවක කාර්යාල සේවක සේවයේ නිලධාරීන්) දමිළ මාධ්‍ය | 30 | 2023.12.12 | | | දේශීය | හොඳයි |
| 6. | සංවර්ධන නිලධාරීන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය සහ ඇගයීම (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි සංවර්ධන නිලධාරීන්) සිංහල මාධ්‍ය | 46 | 2023.12.14<br>2023.12.15 | 112,180.00 | | දේශීය | හොඳයි |
| 7. | සංවර්ධන නිලධාරීන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය සහ ඇගයීම (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි සංවර්ධන නිලධාරීන්) දමිළ මාධ්‍ය | 21 | 2023.12.20<br>2023.12.21 | | | දේශීය | හොඳයි |
| 8. | රියදුරු කාර්ය සාධන පුහුණුව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි රියදුරු මහත්වරුන්) සිංහල මාධ්‍ය | 19 | 2023.12.19 | 33,475.00 | | දේශීය | හොඳයි |
| 9. | රියදුරු කාර්ය සාධන පුහුණුව (ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි රියදුරු මහත්වරුන්) දමිළ මාධ්‍ය | 9 | 2023.12.27 | | | දේශීය | හොඳයි |
| 10. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා ආතති කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | 45 | 2023.12.28 | 28,040.00 | | දේශීය | හොඳයි |
| 11. | තොරතුරු පනත සහ තොරතුරු ඉල්ලීම් සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටළු - එක්දින පුහුණුව | 21 | 2023.12.28 | 4,575.00 | | දේශීය | හොඳයි |

**07**. **පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අදාළ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට දිගුකාලයක් ගත වේ. | අපහරණ කටයුතු කඩිනමින් නිම කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**